# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1847/32 - 2014 ජනවාරි මස 29 වැනි බදාදා - 2014.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51(vi).

**(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2014 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1. කලින් කලට සංශෝධනය කරන ලද සහ අවසන්වරට 2013 අප්‍රේල් මස 11 වැනි දින අංක 1805/34 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මගින් සංශෝධනය කරන ලද 1983 ජූනි මස 3 වැනි දින අංක 248 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1983 මෝටර් වාහන (වාහන තැනීමේ) නියෝග, එහි 2 වැනි නියෝගය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

"2. (1) යම් මෝටර් වාහනයක මිනුම් ප්‍රමාණ, I වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පංතිය හෝ ප්‍රභේදය සහිත මෝටර් වාහන සම්බන්ධයෙන් මෙහි පහත II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති මිනුම් ප්‍රමාණ නොඉක්මවිය යුතු ය :–

දිග, පළල සහ උස

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *මෝටර් වාහනවල පංතිය හෝ ප්‍රභේදය* | *මිලිමීටර* |
| (අ) මෝටර් වාහනයේ සම්පූර්ණ පළල (මෝටර් කෝච් රථයක හැර) | 2,500 |
| (ආ) මෝටර් කෝච් රථයේ සම්පූර්ණ පළල | 2,600 |
| (ඇ) මෝටර් වාහනයේ උස (තට්ටු දෙකේ මෝටර් කෝච් රථයක් හැර) | 3,800 |
| (ඈ) තට්ටු දෙකේ මෝටර් කෝච් රථයක උස | 4,600 |
| (ඉ) මෝටර් කෝච් රථයක හැර ඇක්සල දෙකක් ඇති මෝටර් වාහනයක සම්පූර්ණ දිග | 10,000 |

*(සම්බන්ධිතයි)*

දිග, පළල සහ උස

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *මෝටර් වාහනවල පංතිය හෝ ප්‍රභේදය* | *මිලිමීටර* |
| (*ඊ*) ඇක්සල දෙකකට වැඩියෙන් ඇති මෝටර් වාහනයක සම්පූර්ණ දිග | 11,000 |
| (*උ*) (බර මෝටර් කෝච් රථයක් හැර) මෝටර් කෝච් රථයක සම්පූර්ණ දිග | 12,000 |
| (*ඌ*) ඇදූ රථයක සම්පූර්ණ දිග | 16,000 |
| (*එ*) එක් ට්‍රේලරයක් සහිත ඒකාබද්ධ කළ රථයක සම්පූර්ණ දිග | 17,000 |
| (*ඒ*) බර මෝටර් කෝච් රථයක සම්පූර්ණ දිග | 24,000 |

(2) යම් මෝටර් වාහනයක උස එහි පළල මෙන් සියයට 165 ක (165%) ප්‍රතිශතය නොඉක්මවිය යුතු ය.

(3) (*අ*) යම් මෝටර් වාහනයක ඇක්සල බර, I වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පංතිය හෝ ප්‍රභේදය සහිත මෝටර් වාහන සම්බන්ධයෙන් මෙහි පහත II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ඇක්සල බර නොඉක්මවිය යුතු ය.

මෝටර් වාහනයක ඇක්සල බර

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *මෝටර් වාහනවල පංතිය හෝ ප්‍රභේදය* | *කිලෝ ග්‍රෑම්* |
| (i) රෝද දෙකේ තනි ඇක්සලය සහිත | 6,000 |
| (ii) රෝද හතරේ තනි ඇක්සලය සහිත | 10,000 |
| (iii) රෝද හතරේ ද්විත්ව ඇක්සලය සහිත | 10,000 |
| (iv) රෝද අටේ ද්විත්ව ඇක්සලය සහිත හෝ යම් රෝද අටේ මීටර් 2.45 ක පරතරයක් නොඉක්මවන මධ්‍යගත වූ යම් අඛණ්ඩ ඇක්සල දෙකක් සහිත | 16,500 |
| (v) රෝද දොළහේ පසුපස ත්‍රිත්ව ඇක්සල සහිත හෝ රෝද දොළහේ මීටර් 3.66 ක පරතරයක් නොඉක්මවන යම් අඛණ්ඩ ඇක්සල තුනක් සහිත | 22,000 |

(*ආ*) යම් මෝටර් වාහනයක වාහනයේ දළ බර, I වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පංතිය හෝ ප්‍රභේදය සහිත මෝටර් වාහන සම්බන්ධයෙන් මෙහි පහත II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති දළ වාහන බර නොඉක්මවිය යුතු ය.

දළ වාහන බර

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *මෝටර් වාහනවල පංතිය හෝ ප්‍රභේදය* | *කිලෝ ග්‍රෑම්* |
| (i) රෝද හතරේ පසුපස ඇක්සලය සහිත මෝටර් වාහනයක | 15,275 |
| (ii) රෝද අටේ පසුපස ඇක්සලය සහිත මෝටර් වාහනයක | 21,300 |
| (iii) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද දෙකේ පසුපස ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද හතරේ ඇක්සලය සහිතව ඇදූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 19,900 |
| (iv) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද හතරේ පසුපස ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද හතරේ ඇක්සලය සහිතව ඇදූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 23,500 |
| (v) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද හතරේ පසුපස ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද අටේ ද්විත්ව ඇක්සලය සහිතව ඇදූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 29,800 |

(සම්බන්ධිතයි)

දළ වාහන බර

| *I වැනි තීරය* <br> *මෝටර් වාහනවල පංතිය හෝ ප්‍රභේදය* | *II වැනි තීරය* <br> *කිලෝ ග්‍රෑම්* |
|---|---|
| (vi) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද අටේ පසුපස ද්විත්ව ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද හතරේ ඇක්සලය සහිතව ඇඳූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 30,400 |
| (vii) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද හතරේ පසුපස ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද දොළහේ ත්‍රිත්ව ඇක්සලය සහිතව ඇඳූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 33,900 |
| (viii) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද අටේ පසුපස ද්විත්ව ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද අටේ ද්විත්ව ඇක්සලය සහිත ඇඳූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 36,700 |
| (ix) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද හතරේ පසුපස ද්විත්ව ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද දොළහේ ත්‍රිත්ව ඇක්සලය සහිත ඇඳූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 31,200 |
| (x) පැදවීමේ ඒකකය සඳහා රෝද දෙකේ ඉදිරිපස ඇක්සලය සහ රෝද අටේ පසුපස ද්විත්ව ඇක්සලය සහිතව සහ ට්‍රේලරය සඳහා රෝද දොළහේ ත්‍රිත්ව ඇක්සලය සහිත ඇඳූ රථයක හෝ ඒකාබද්ධ කළ රථයක | 42,500” |

2. 2005 පෙබරවාරි මස 16 වැනි දින අංක 1380/14 සහ 2011 ඔක්තෝබර් මස 5 වැනි දින අංක 1726/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රවල* පළ කරන ලද නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

02 - 309

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.